**සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යකරණය - 2022**

----------------------------------------------------------------------------------------

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ - අතිරේක මූල්‍යකරණය පිළිබඳ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2021 ඔක්තෝබර් 07 දින එළඹි අංක L 4121-SRI සහ අංක G9222-SRI දරන ණය සහ ප්‍රදාන ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ණය සහ ප්‍රදාන ගිවිසුම් ප්‍රකාරව, සෞඛ්‍ය අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය වන අතර මධ්‍යම, උතුරු මැද, සබරගමුව සහ ඌව පළාත් සභා හතර ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ මූලික ව්‍යාපෘතියේ විෂය පථය ක්‍රියාවට නැංවීම සඳහා ඉහත සඳහන් කර ඇති වෙන්කිරීම් වල ඇති වන අරමුදල් හිඟය පියවීම, COVID-19 වසංගතයේ පවතින තුන්වන රැල්ල කළමනාකරණය කිරීම හේතුවෙන් තවදුරටත් වැඩි වෙමින් පවතින ඉල්ලුම සපුරාලීම, ඉහළ ගුණාත්මකභාවයෙන් යුත් පොකුරු රෝහල් වශයෙන් සංවර්ධනය කෙරෙන මුල් ව්‍යාපෘතියේ දිස්ත්‍රික්ක නවයට අයත් එක් එක් දිස්ත්‍රික්කය තුළ අවම වශයෙන් එක් ද්විතීයික සත්කාරක පහසුකමක් (COVID-19 සිද්ධි කළමනාකරණය ඇතුළුව) සංවර්ධනය කිරීම සඳහා සහාය ලබා දීම, දිවයිනේ ඉහළ යන COVID-19 තත්ත්වය සැලකිල්ලට ගෙන දුරස්ථ සහ විද්‍යුත් ඉගෙනුම් සඳහා ලබා ගත හැකි පහසුකම් පුළුල් කිරීම, ව්‍යාපෘතියේ අවසන් දිනය මාස 24 කින් හෝ 2025 නොවැම්බර් දක්වා දීර්ඝ කර, පුළුල් කරන ලද ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කර, ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සහ COVID-19 ආශ්‍රිත මූල්‍යකරණ පරතර සපුරාලීම සඳහා දරිද්‍රතාව අවම කිරීම සඳහා වන ජපාන අරමුදලින් එ.ජ.ඩො. මිලියන 3 ක ප්‍රදානයක් ලබා ගැනීම සඳහා ප්‍රවේශ වීමයි. මෙම ණය සහ ප්‍රදාන ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 24,538.5 කට සමාන එ.ජ.ඩො. මිලියන 123 කි. එයින් රුපියල් මිලියන 22,543.5 කට සමාන එ.ජ.ඩො. මිලියන 113 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 1,995.0 ක් මූල්‍යකරණය කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරයි. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2021 නොවැම්බර් 17 වන දින ආරම්භ කර ලද අතර 2025 නොවැම්බර් 30 දින වන විට ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණි.

**1.3 මතය**

2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා එහි වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයේදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| ගිණුම්කරණ අඩුපාඩුව | මුදල රු. | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ප්‍රමාද ගාස්තු (LD) සටහනක් මගින් හෙළිදරව් නොකර වියදම් වලට ආපසු බැර කර තිබුණි. | 14.5 | 2022 වර්ෂයේදී මෙම අඩු කිරීම් ආපසු ගෙවීමේ වගකීමක් නොමැති බැවින්, එම මුදල් ජර්නල සටහන් හරහා අදාළ වියදම් ගිණුම් වෙත බැර කර අයිතම සඳහා දරන ලද සැබෑ පිරිවැය පෙන්වා ඇත. | ගිණුමේ සටහනක් මගින් මේ පිළිබඳව හෙළිදරව් කළ යුතුය. |

**2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි අංක 753(1) සහ 753(2) | නිකුත් කරන නිලධාරියා පොදු ආකෘති පත්‍ර අංක 141 හි නිකුත් කිරීමේ නියෝගය සකස් කළ යුතු අතර ලබන නිලධාරියා පොදු ආකෘති පත්‍ර අංක 219 හි ලැබීම් නියෝගයක් සකස් කළ යුතුය. කෙසේ වෙතත් අදාළ නිලධාරීන් විසින් රු. මිලියන 2,597 ක් වටිනා වෛද්‍ය උපකරණ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ජෛව වෛද්‍ය ඉංජිනේරු අංශයට ලැබුණු භාණ්ඩ සඳහා තොග ලැබීම් පත් නිසි පරිදි නිකුත් කරන ලද අතර ජෛව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය මඟින් තොග ලේඛන යාවත්කාලීන කරන ලදී. ජෛව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයට ලැබෙන කොවිඩ් සත්කාරයට අදාළ උපකරණ අවශ්‍යතාවය අනුව ඔවුන් විසින් බෙදා හැරීම සිදු කරනු ලබන අතර අයිතම බෙදාහැරීම පිළිබඳව අපට පාලනයක් නොතිබුණි. | මූල්‍ය රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |
| (ආ) | 2019 මාර්තු 05 දිනැති අංක 1/2019 කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 වගන්තිය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතුය; කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළ කමිටුව රැස්වී තිබුණේ අවස්ථා දෙකකදී පමණි. | 2022 වසර සඳහා මෙහෙයුම් කමිටු රැස්වීම් දෙකක් පැවැත්වා තිබුණි. එම කාලය තුළ ඇති වූ දුෂ්කරතා හේතුවෙන් වසරේ සෑම කාර්තුවකටම මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. | චක්‍රලේඛයේ උපදෙස් වලට අනුකූල විය යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

**(අ)**

| සංරචකය | ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්යසාධනය ඒකක | 2022 දෙසැම්බර් 31 දිනට ළඟා කරගෙන ඇති කාර්යසාධනය ඒකක | විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| අදාළ නොවේ. | ප්‍රාථමික සෞඛ්‍ය සේවා සහ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා ඒකක 42 ක යටිතල පහසුකම් සංවර්ධනය. | 42 | i. ඇගයීම් අදියර යටතේ ඒකක 32 කි.<br>ii. ඒකක 10 ක විෂය පථය සංශෝධනය කිරීම. | මෙම ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය කාර්යසාධනයක් නොමැත. | ආර්ථික අර්බුදය සහ පවතින අරමුදල් ප්‍රමාණවත් නොවීම. |

**කළමනාකරණයේ ප්‍රතිචාරය**

2022 වර්ෂයේදී ආර්ථික අර්බුදයත් සමඟ ද්‍රව්‍ය මිල විශාල ලෙස ඉහළ ගිය අතර පවතින අරමුදල් ඒකක හතළිස් දෙකේම පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රමාණවත් නොවූ අතර පිරිවැය අවම කර ගැනීම සඳහා උප ව්‍යාපෘති නවයක විෂය පථය වෙනස් කිරීමේ හැකියාව සෙවීමට ව්‍යාපෘතියට සිදු විය. විෂය පථය වෙනස් කිරීමේ ක්‍රියාවලියෙන් පසු සමහර උප ව්‍යාපෘති ලංසු තැබීමේ ක්‍රියාවලියේ පවතින අතර ප්‍රමාණවත් අරමුදල් නොමැතිකම හේතුවෙන් උප ව්‍යාපෘති කිහිපයක් නතර කිරීමට සිදුවේ.

**විගණකගේ නිර්දේශයන්**

ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව නියමිත කාලය තුළ රැස්කර අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.

(ආ)

| සංරචකය | ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය | ළඟා කරගෙන ඇති කාර්යසාධනය | | |
| | | ඒකක | ඒකක | | |
| අදාළ නොවේ. | ප්‍රාථමික වෛද්‍ය සේවා ඒකක සහ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා ඒකක 10කි. | 10 | - | භෞතික හා මූල්‍ය කාර්ය සාධනය සිදු කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ගේ ඉල්ලීම මත මිල වැඩිකිරීමේ ප්‍රතිපාදන ලබා දීම. |

| | |
|---|---|
| **කළමනාකරණයේ ප්‍රතිචාරය** | කොන්ත්‍රාත්කරුවන්ගේ ඉල්ලීම මත ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු කෙටි කාලීන කොන්ත්‍රාත්තු සඳහා මිල වැඩි කිරීමේ ප්‍රතිපාදන ඇතුළත් කරන ලදී. මෙම ක්‍රියාවලියට කාලය ගත වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදයන් සිදු විය. |
| **විගණකගේ නිර්දේශයන්** | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව නියමිත කාලය තුළ රැස්කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

### 3.2 මතභේදාත්මක ගනුදෙනු

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ICU වාතාශ්‍ර යන්ත්‍ර 25ක් 2021 දෙසැම්බර් 27 වැනි දින රුපියල් මිලියන 90ක් ගෙවා මිලදී ගෙන ඇති අතර ඉන් රුපියල් මිලියන 25ක් වටිනා යන්ත්‍ර හතක් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට තාවකාලික භාවිතය සඳහා ලබා දී ඇතත් එම යන්ත්‍ර ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වසරකුත් මාස 09 ක් තිබී ඇත. හඳුනාගත් අවශ්‍යතා අනුව අදාළ යන්ත්‍ර සවිකර මහජන ප්‍රයෝජනය සඳහා ලබාදී තිබිය යුතුය. | රෝහල්වල අවශ්‍යතා අනුව භාණ්ඩ බෙදා හැරීමේ වගකීම ජෛව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය සතු වන අතර ව්‍යාපෘතියට වෛද්‍ය උපකරණ පිළිබඳ පාලනයක් නොමැත. | ව්‍යාපෘතිය මගින් රෝහල් සඳහා මිලදී ගත් යන්ත්‍ර කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට තාවකාලික භාවිතය සඳහා ලබාදී ඇති අතර එම යන්ත්‍ර වහාම ආපසු ලබාගෙන අවශ්‍ය රෝහල් වෙත ලබාදීමට ව්‍යාපෘතිය මඟින් අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) | අදාළ යන්ත්‍ර සපයා සවි කිරීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම මත 2021 වසරේදී පෞද්ගලික ආයතනයකින් මිලදී ගත් දැඩි සත්කාර ඒකක වාතාශ්‍ර යන්ත්‍ර 25න් ජාතික රෝහලට ලබාදී ඇති යන්ත්‍ර 05ක් සහ ජෛව වෛද්‍ය ඒකකයට ලබාදුන් එක් යන්ත්‍රයක් 2023 මැයි 08 දින වන විටත් සවිකර නොතිබුණි. කෙසේ වෙතත්, 2022 මාර්තු 15 දින රු.මිලියන 4.3 ක් වටිනා බැංකු ඇපකරයක් ලබාගෙන ඇති අතර, මෙම ගනුදෙනුවට අදාළ අවසාන ගෙවීම වන රු. මිලියන 18 ක් 2022 මාර්තු 24 දින ගෙවා තිබුණි. මෙම බැංකු ඇපකරයේ කාලසීමාව 2023 අප්‍රේල් 23 දිනෙන් අවසන් වී ඇති බවත්, එහි වලංගු කාලය දීර්ඝ කිරීමට කටයුතු නොකළ නිසා රජයට පාඩුවක් සිදුවිය හැකි බවත් නිරීක්ෂණය විය. | ජෛව වෛද්‍ය ඉංජිනේරු අංශයේ අධ්‍යක්ෂවරයාගේ ලිඛිත නිර්දේශය මත ගෙවීම් සිදු කර ඇති අතර, යන්ත්‍ර සවි කිරීම සඳහා සූදානම් වූ පසු ස්ථාපනය සිදු කරනු ලැබේ. | නිසි සැලසුම් සකස් කර පාඩුව අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |